සිංහල පරිවර්තනය

# උතුරු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින තනතුරු වලට බඳවා ගැනීම සඳහා වූ විවෘත හා සීමිත තරග විභාගය - 2021

උතුරු පළාත සභාවේ කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින පහත සඳහන් ලේඛනය - I හි දක්වා ඇති තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පැවැත්වීමට නියමිත බව මෙයින් දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 09.08.2021 වේ.

- **ලේඛනය –I**

| අංක | විභාගයේ නම | විභාග අංකය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක IIIවන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය –2021 | I | 08 |
| 02 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ පේෂකර්ම උපදේශක IIIවන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය –2021 | II | |
| 03 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ කුඩා අත්කර්මාන්ත උපදේශක IIIවන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය –2021 | III | 11 |
| 04 | උතුරු පළාත් රාජ්‍ය සේවයේ කුඩා අත්කර්මාන්ත උපදේශක IIIවන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය –2021 | IV | |

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද **I-ලේඛනයේ** දක්වා ඇති තනතුරු වලට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය/බඳවා ගැනීමේ පරිපාටිය මගින් නිර්දේශිත කොන්දේසින් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්, මුදල් රෙගුලාසින් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ *2013.07.03* වන දිනැතිව අතිවිශේෂිත ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයට අදාළ ආයතන කාර්ය පටිපාටි සංග්‍රහය යනාදීන්ට අනුකූලව හා බඳවා ගන්නා කාලවාකවානුවේ දී සකස් වෙන කිසියම් සංශෝධනයන්ට ද යටත්ව තෝරා ගනු ලබන අපෙක්ෂකයන් **I-ලේඛනය** මගින් දක්වා ඇති තනතුරු වල IIIවන ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබේ.

02.2 විවෘත තරග විභාගය මගින් පත්වීම සඳහා තෝරා ගන්නා අපෙක්ෂකයන් පත්වීම් දින සිට අවුරුදු තුනක(03) පරිවාස කාලයට යටත් කොට හා සීමිත තරග විභාගය මගින් පත්වීම සඳහා තෝරා ගන්නා අපෙක්ෂකයන් පත්වීම් දින සිට අවුරද්දක වැඩබලන පරිවාස කාලයට යටත් කොට IIIවන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි ඉහත ලේඛන - I මගින් සඳහන් කර ඇති තනතුරු වල IIIවන ශ්‍රේණයට බඳවා ගත් දින සිට වසර තුනක් ඉක්මවීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වී සිටිය යුතුයි.

02.3 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයකි. එබැවින් මෙම නියෝගය යටතේ පත්වීම ලබා ගන්නා අපෙක්ෂකයන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

02.4 තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති හා සම්බන්ධයෙන් මේ වන විට බලගන්වා ඇති හා වත්මන් හි ක්‍රියාත්මක කෙරෙන විධිවිධානයන්ට අනුකූලව හා ඒ මගින් උක්ත කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා වූ කිසියම් නියෝගයන්ට ද අනුකූලව ක්‍රියා කළ යුතුයි.

02.5 පත්වීම් සංඛ්‍යාව හා එය ක්‍රියාත්මක වන දිනය වැනි කරුණු යනාදිය පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත් කිරීමට නියමිත සංඛ්‍යාව **I-ලේඛනය** හි දක්වා ඇති පරදි වේ එමෙන්ම යම් පුරප්පාඩුන් හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය :-

අංක *03/2016* දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව, **MN 1 - 2016** දරණ වැටුප් කාණ්ඩයට අනුකූලව **I-ලේඛනය** හි සඳහන් කර ඇති තනතුරු වලින් IIIවන ශ්‍රේණියේ තනතුරට වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **27, 140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45, 540/-**කි. (රුපියල් 28,040 දරණ වැටුප් පියවරට එළඹීමට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුයි)

## 04. සාමාන්‍ය සුදුසුකම්

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය වන පරිදි අයදුම්කරුවන් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සිටිය යුතුයි එමෙන්ම මනා චරිත.වත් පුද්ගලයකු ද විය යුතුයි.

04.3 අ) අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචිය උතුරු පළාත විය යුතුයි. මෙම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථමයෙන් වූ වසර හයක (06) කාල පරිච්ඡේදයෙන් අවම වශයෙන් වසරක තුනක (03)කාල පරිච්ඡේදයක් හෝ උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය.

**හෝ**

ආ) අයදුම්කරුවන් හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතුයි. අවම වශයෙන් අවුරුදු පහක් (05) ක් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. (***සම්මුඛ පරීක්ෂණයේ දී ස්ථිර පදිංචි සනාථ කිරීමට චන්ද නාම ලේඛනයේ උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි**)

04.4 අයදුම්කරුවන් අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට හෝ ඊට ප්‍රථම **සුදුසුකම් සියල්ල සපුරා** තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

### 05.1 පේෂකර්ම උපදේශක IIIවන ශ්‍රේණියට විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම

***විභාග අංක - I***

**(අ) අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ/සිංහළ), ගණිතය යනාදි විෂයයන් ඇතුළු විෂයයන් හතරක් විශිෂ්ඨ සම්මාන සමග විෂයයන් හයක් **(06)** ක් සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් හෝ සමත්වී තිබිය යුතුයි (පොදු පරීක්ෂණය හැර)

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීය සුදුසුකම් :-**

01. පේෂකර්ම ගණනය සම්බන්ධව ඇඟළුම් අත්කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසන් විභාගයෙන් විශිෂ්ඨ සාමාර්ථයක් සහිත සහතියක් හිමිකර තිබිය යුතුයි. (ඇඟළුම් අත්කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවත්වන වසරක පුහුණු පාඨමාලාව)

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (N.V.Q Level) 02/03 සහතිකය - පේෂකර්ම / ඇඟළුම් අත් කර්මාන්ත

02. බඳවා ගැනීමේ අවස්ථාව වන විට මෙම තනතුරට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට සුදුසුකම් සපුරා ඇති විභාග අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවට අඩු වශයෙන් දක්නට ලැබෙන විට බඳවා ගැනීමේ අරමුණට පහත සඳහන් පේෂකර්මයට අදාළ සහතිකය අතිරේක සුදුසුකම් වශයෙන් සැලකිල්ලට ගනු ලැබේ.

    (i) රජයේ ලලිතකලා ආයතනයෙන් ප්‍රදානය කරන ලද ඉහළ ශ්‍රේණියේ සහතිකය.
    (ii) වානිජ පේෂකර්ම ආයතනයෙන් / වෘත්තීය කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද සහතිකය.
    (iii) අන්යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානයක පේෂකාර්මිකයකු වශයෙන් වසරක සේවා අත්දැකීම් ඇති බවට කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කළ සහතිකය.

**(ඇ) වයස් සීමාව :-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **18 ට නොඅඩු හා,** වයස අවුරුදු **40 ට නොවැඩි විය යුතුයි**. දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරණ සේවකයන්ට වයස් සීමාව බලපාන්නේ නැත.

## 05.2 පේෂකර්ම උපදේශක IIIවන ශ්‍රේණියට සීමිත තරග විභාගය මගින් බඳවා ගැනීම

*විභාග අංක - II*

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **වාර දෙකකට** භාෂාව (දෙමළ/සිංහල), ගණිතය යනාදි විෂයයන් ඇතුළු විෂයයන් 02ක් විශිෂ්ඨ සම්මාන සමග විෂයයන් හයක් (06) ක් සමත්වී තිබිය යුතුයි.

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීය සුදුසුකම් :-**

පේෂකර්ම ගණනය සම්බන්ධව ඇගළුම් අත්කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසන් විභාගයෙන් විශිෂ්ඨ සාමාර්ථයක් සහිත සහතියක් හිමිකර තිබිය යුතුයි. (ඇගළුම් අත්කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවත්වන වසරක පුහුණු පාඨමාලාව)

**සටහන :-**

බඳවා ගැනීමේ අවස්ථාව වන විට මෙම තනතුරට අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට සුදුසුකම් සපුරා ඇති විභාග අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවට අඩු වශයෙන් දක්නට ලැබෙන විට බඳවා ගැනීමේ අරමුණට පහත සඳහන් පේෂකර්මයට අදාළ සහතිකය අතිරේක සුදුසුකම් වශයෙන් සැලකිල්ලට ගනු ලැබේ.

(i) රජයේ ලලිතකලා ආයතනයෙන් ප්‍රදානය කරන ලද ඉහළ ශ්‍රේණියේ සහතිකය.

(ii) වානිජ පේෂකර්ම ආයතනයෙන් / වෘත්තීය කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද සහතිකය.

(iii) අන්‍යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානයක පේෂකාර්මිකයකු වශයෙන් වසරක සේවා අත්දැකීම් ඇති බවට කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කළ සහතිකය.

**ඒ සමගම**

**(ඇ) පළපුරුද්ද :-**

උතුරු පළාත් කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක් (05) අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. ඒ අනුව එම දෙපාර්තමේන්තු ප්‍රධානියා එම සේවයට අදාළ ලියකියවිලි සහතික කළ යුතුයි.

**(ඇ) වයස් සීමාව :-**

සීමිත තරග විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ට **උපරිම වයස් සීමාව බලපාන්නේ නැත**

## 05.3 කුඩා කර්මාන්ත උපදේශක III ශ්‍රේණියට විවෘත තරග විභාගය මගින් බඳවා ගැනීම

*විභාග අංකය - III*

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **එකවර** භාෂාව (දෙමළ/සිංහල), ගණිතය යනාදි විෂයයන් ඇතුළු විෂයයන් හතරක් විශිෂ්ඨ සම්මාන සමග විෂයයන් හයක් (06) ක් සමත්වී තිබිය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක් විෂයයක් හෝ සමත්වී තිබිය යුතුයි (පොදු පරීක්ෂණය හැර)

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීය සුදුසුකම් :-**

අයදුම්කරු පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වසරකට නොඅඩු වෘත්තිය පළපුරුද්දක් හිමිකර තිබිය යුතුයි. (මැටිභාණ්ඩ, වඩු කර්මාන්තය, කෙඳි වැඩ, මේසන් වැඩ වැනි) ඒ සමගම අයදුම්කරු ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (N.V.Q) - 03 සම්පූර්ණ කර තිබිය යුතුයි.

**හෝ**

අයදුම්කරුගේ රැකියාව හා සම්බන්ධ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (N.V.Q) - 04 සම්පූර්ණ කර තිබිය යුතුයි. (මැටිභාණ්ඩ, වඩු කර්මාන්තය, කෙඳි වැඩ, මේසන් වැඩ වැනි).

**හෝ**

අයදුම්කරු පහත සඳහන් තමන් සම්බන්ධ ක්ෂෙත්‍රයන් හි එක් වසරකට නොඅඩු වෘත්තිය පළපුරුද්දක් ලබා තිබිය යුතුයි. (මැටිභාණ්ඩ, වඩු කර්මාන්තය, කෙඳි වැඩ, මේසන් වැඩ වැනි) ඒ සමගම කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුයි.

**(ඇ) වයස් සීමාව :-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **18 ට නොඅඩු හා,** වයස අවුරුදු **30 නොවැඩි විය යුතුයි.**

## 05.4 කුඩා කර්මාන්ත උපදේශක III ශ්‍රේණියට සීමිත තරග විභාගය මගින් බඳවා ගැනීම

***විභාග අංකය - IV***

**(අ) අධ්‍යාපන සුදුසුකම් :-**

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **වාර දෙකකට** භාෂාව (දෙමළ/සිංහල), ගණිතය යනාදි විෂයයන් ඇතුළු විෂයයන් **02**ක් විශිෂ්ඨ සම්මාන සමග විෂයයන් හයක් **(06)** ක් සමත්වී තිබිය යුතුයි.

**(ආ) වෘත්තීය අධ්‍යාපනය / වෘත්තීය සුදුසුකම් :-**

අයදුම්කරු පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වසරකට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් හිමිකර තිබිය යුතුයි. (මැටිභාණ්ඩ, වඩු කර්මාන්තය, කෙඳි වැඩ, මේසන් වැඩ වැනි) ඒ සමගම අයදුම්කරු ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q) - 03 සම්පූර්ණ කර තිබිය යුතුයි..

**හෝ**

අයදුම්කරුගේ රැකියාව හා සම්බන්ධ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q) - 04 සම්පූර්ණ කර තිබිය යුතුයි. (මැටිභාණ්ඩ, වඩු කර්මාන්තය, කෙඳි වැඩ, මේසන් වැඩ වැනි).

**හෝ**

අයදුම්කරු පහත සඳහන් තමන් සම්බන්ධ ක්ෂෙත්‍රයන් හි එක් වසරකට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් ලබා තිබිය යුතුයි. (මැටිභාණ්ඩ, වඩු කර්මාන්තය, කෙඳි වැඩ, මේසන් වැඩ වැනි) ඒ සමගම කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවත්වනු ලබන ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර තිබිය යුතුයි.

**(ඇ පළපුරුද්ද :-**

උතුරු පළාත් කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර පහක් (05) අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුයි. ඒ අනුව එම දෙපාර්තමේන්තු ප්‍රධානියා එම සේවයට අදාල ලියකියවිලි සහතික කළ යුතුයි.

**(ඇ) වයස් සීමාව:-**

සීමිත තරග විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ට **උපරිම වයස් සීමාව බලපාන්නේ නැත**.

## 06 බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත පරීක්ෂණයකින් හා කුසලතා පදනමින්, බඳවා ගන්නා අවස්ථාවේදී බලගැන්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පරිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදියට අනුකූලව හා **ලේඛන– I** හා දක්වා ඇති තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. මෙම නිවේදනය මගින් ඉල්ලා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බවට අනාවරණය වන විට මෙම තනතුරට හිමි හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂයේ දී සුදුසුකම් සමග සියලුම ලිපිලේඛනද පරීක්ෂා කරනු ලැබේ ඒ සඳහා ලකුණු කිසිවක් පිරිනමනු නොලැබේ.

06.2 උක්ත සුදුසුකම් සියල්ල සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් ලිඛිත විභාගයේදී සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළ ලකුණු අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩු සඳහා පත් කිරීමට සම්මුඛ පරීක්ෂණයට තෝරා ගනු ලැබේ.

06.3 පේෂකර්ම උපදේශක හා කුඩා කර්මාන්ත උපදේශක තනතුරු වලට බඳවා ගැනීමේ දී, ඉහත තනතුරුවලට **පවතින පුරප්පාඩු වලින් 30%** ට නොඉක්මවූ සංඛ්‍යාවක් සීමිත තරග විභාගයක් මගින් බඳවා ගන්නා අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.

06.4 පුරප්පාඩු වලින් *03%*ක් ආබාධිතයන් වෙනුවෙන් වෙන් කරනු ලැබේ. එම අපෙක්ෂකයන් පත්විමට තෝරා ගන්නා පත් කරන විට අදාළ තනතුරේ සේවය සඳහා තම ශාරිරික/මානසික සුදුසුකම් බාධාවක් නොවන බවට විශේෂිත වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතුයි.

## 07. විභාග ගාස්තු

අයදුම්කරුවන් තමන් පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකදි රුපියල් ***500.00*** ක් වටිනා මුදලක් **“ ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත”** ගේ තැන්පත් ගිණුම් අංක**“3401”**ට බැර කළ බවට කුවිතාන්සියක් ලබා අයදුම්පත්‍රයේ අදාල ස්ථානයේ අලවා යොමු කළ යුතුයි. කිසිදු හේතුවක් නිසා හෝ මෙම ගාස්තුව නැවත ගෙවන්නේ නැති අතර වෙනත් විභාගයන් සඳහාද මෙම ගාස්තුය මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 08. අයදුම් කිරීමේ ක්‍රමය

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් *(සෙ.මී21.x සෙ.මී 29)* කඩදාසියේ *1* සිට 11.1 දක්වා වූ ඡේද පළමු කොටසේ ද, 11.2 සිට 15 දක්වා වූ ඡේද දෙවන පිටුවේද, ඉතිරි කොටස් අනෙක් පිටුවටද ඇතුළත් වන පරිදි අයදුම්පත්‍රය සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 09.08.2021 වන දින හෝ ඊට ප්‍රථම ලබා ගත හැකි පරිදි,“ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය”** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 උක්ත තරග විභාගයෙන් එක් විභාගයකට අමතරව අයදුම් කිරීමට මනාප අයදුම්කරුවන්, එක් එක් තරග විභාගයන් සඳහා අයදුම්පත් වෙන වෙනම යොමු කිරීමට කටයුතු කළ යුතු අතරම විභාග ගාස්තු අයදුම් කරන සෑම විභාගයකටම වෙන වෙනම ගෙවිය යුතුයි.

08.3 අයදුම්පත / අයදුම්පත්‍ර යොමු කරන ලිපි කවරයේ උඩ වම් කෙළවරේ **“උතුරු පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත / සීමිත තරග විභාගය –2021” යනුවෙන්** සඳහන් කර තිබිය යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ද පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ..

08.4 අයදුම්පත්‍රයේ **ඡායා පිටපතක්** තම භාරයේ තබා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකියි. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ පූර්ව නිශ්චිත පිටපත් භාර ගනු නොලැබේ. විභාග ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. **විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් කිරමක් නොවන බව සැළකිය යුතුය.**

08.5 අයදුම්පත් යොමු කරන අයදුම්කරුවන් හට විභාග දිනයට අවම වශයෙන් දින තුනකට (03) කට පෙරාතුව හෝ කිසියම් අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශපත්‍ර නොලැබුණේ නම් පහත සඳහන් තොරතුරු සමග **“ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය”** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය -021 221 9939, ෆැක්ස් අංකය -021 221 9940)

**සම්බන්ධ වන විට ඉදිරිපත් කළ යුතු තොරතුරු:-**

විස්තර සඳහන් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.

08.6 උක්ත විභාගයට අයදුම් කළ අයදුම්පත්‍ර ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට කැඳවා ඇති සුදුසුකම් සියල්ල සපුරා නැති අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ ඒ බවට නිවේදනයක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය ඔප්පු කිරීම :-

අපේක්ෂකයන් තමන් පෙනී සිටින සියළුම විෂයයන් සඳහා විභාග ශාලා අධීක්ෂණ නිලධාරි තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය සනාථ කළ යුතුයි. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එකක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ විභාගයට පෙනී සිටින විට ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ලේකම්වරයාගේ"** අභිමතය පරිදි ප්‍රතික්ෂේප කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභවේ ලේකම්වරයා විසින් පනවනු ලබන නීතිරීතීන්ට අනුකූලව කටයුතු කිරීමට නැඹුරුවිය යුතුයි.

## 10. සාවද්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්පත්‍රය සම්පූර්ණ කරන විට දැඩි අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලා ගත යුතුයි. මෙම විභාග රීතීන්ට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථමයෙන් හෝ විභාගයට පසුව හෝ කුමණ හෝ අවස්ථාවකදී හෝ සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වුවහොත් අපෙක්ෂකත්වය සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. එමෙන් ම අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් සාවද්‍ය තොරතුරු බව අනාවරණ වන කුමණ අවස්ථාවකදී හෝ පළාත් රාජ්‍ය සේවයෙන් නෙරපා හැරීමට ඉඩකඩ තිබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අයදුම්කරුවෙකු විසින් ම තම අත්සන සහතික කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අයදුම්කරුවෙකු වේ නම් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් විසින් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී, සාම විනිසුරු, දිවුරුම් ප්‍රකාශක නිලධාරී, නීතිඥ, නොතාරිස්වරයෙකු, නාවික හමුදාව, යුදහමුදාව, ගුවන් හමුදාව යනාදියෙහි අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් *498,960.00* ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් වශයෙන් ලබන්නා වූ ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් සභා නිලධාරියෙකු, ආගමික නිකායන් හාර ආගමික නායකයන් වැනි අයගෙන් කෙනෙකු සහතික කළ යුතුයි.

## 12. විභාග සැලැස්ම :-

### 12.1 පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට විවෘත / සීමිත තරග විභාගය මගින් වූ බඳවා ගැනීම

මෙම විභාග ලිඛිත හා වෘත්තිය පරික්ෂණ යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින්(02) සමන්විත වන අතර මෙම විභාගය දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වීමට නියමිතය. අයදුම් කළ භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

**01. ලිඛිත විභාගය (විවෘත / සීමිත තරග විභාගය)**

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01. | අන්‍යන්ත්‍ර පේපකර්මය සම්බන්ධයෙන් වූ ගණිතමය හා පේපකර්මය හා බැඳි සාමාන්‍ය දැනුම | 1. ඇස්තමේන්තුව සකස් කිරීම<br>2. කාල පුරෝකථනය හා වැඩ<br>3. නිෂ්පාදන – ඒකක සියල්ල සම්බන්ධයෙන් වියදම් ගණනය කිරීම<br>4. තෙනියර්, රෙක්ස්, කපු නූල් යන වර්ගයේ නූල් සමීක්ෂණය කිරීම<br>5. නූල් වර්ගයේ ගණනය, ස්කන්ධය යනාදිය සමීක්ෂණය කිරීම<br>6. අන්‍යන්ත්‍ර පේප කර්මය සම්බන්ධයෙන් අත්‍යාවශ්‍ය මූලික අමුද්‍රව්‍ය යනාදිය<br>7. නූල් සම්බන්ධයෙන් වූ සාමාන්‍ය අවශ්‍යතාවයන් හඳුනාගැනීම.<br>8. ඇලවීම, පැල්ලම් ඉවත් කිරීම, සම්පූර්ණ කිරීම, සායම් දැමීම යනාදිය පිළිබඳ දැනුම<br>9. නිෂ්පාදිත සාරි වර්ග අලෙවිය හා සබැඳි දැනුම<br>10. සාරි අත්කර්ම පිළිබඳ යන්ත්‍රවල නම් හා ඒවායේ භාවිතය සම්බන්ධ දැනුම | පැය *01* | *100* |
| 02. | පේපකර්ම අන්‍යන්ත්‍රය සම්බන්ධයෙන් වූ කෙටුම්පත හා රෙදි නිෂ්පාදනය හා බැඳි සැලැස්ම කෙටුම් කිරීම | 1. වම් දිසාවේ පිත්තුරය<br>2. ස්ථාවර මෝස්තර පැති පෙනුම ඉදිරිපස<br>3. සැටින් බොක්ස් එකේ දිග හා පළල<br>4. පේපකර්ම විවීමේ නූල් රෝල මැනීමේ සිනියම හෙක් හා ග්‍රිල් උත්තරාං පැගීමේ ලෑලි දෙකින් තුවායන් විවීමේ කෙටුම්පත<br>5. හිල්ස් ඇහිරීම් ක්‍රමයට සැකසීම<br>6. 2, 4, 6, 8 යන පිළිවෙළට හිල්ස් ඇහිරීමේ ක්‍රමවේදය සකස් කිරීම | පැය *01* | *100* |

02. වෘත්තීය පරීක්ෂණය (විවෘත තරග විභාගයට)

| ලකුණු ප්‍රදානය කිරීමේ මූලික කරුණු | කාලය | ලකුණු |
|---|---|---|
| **අ). විවීමේ අත්යන්ත්‍රය තියාමනය කිරීම**<br>01. නූල හඳුනා ගැනීම<br>02. පේෂකර්ම විවීමේ නූල හා නූල් හරස් අතට එතීම<br>03. විවීමේ නූල සැකසීම | මිනිත්තු 30 | 50 |
| **ආ). විවීම**<br>01. පාගන ලෑල්ල සැකසීම<br>02. විවීමේ පටිපාටිය | මිනිත්තු 30 | 50 |
| **සම්පූර්ණ** | පැය **01** | **100** |

**සටහන** :-

මෙය තරග විභාගයක් වන බැවින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන්නේ එක් ප්‍රශ්න පත්‍රයකට වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් ලකුණු හතලිහ ප්‍රතිශතයක් (40%) ලබා ගැනීමෙන් පමණක් බව සැලකිල්ලට ගත යුතුයි. පේෂකර්ම උපදේශක III වන ශ්‍රේණියට විවෘත තරග විභාගය මගින් වූ බඳවා ගැනීම ලිඛිත විභාගය හා වෘත්තීය පරීක්ෂණය යනාදියේ සම්පූර්ණ ලකුණු අනුපිළිවෙල අනුව සිදු කරනු ලැබේ.

## 12.2 කුඩාඅත්කර්මාන්ත උපදේශක IIIවන ශ්‍රේණියට විවෘත / සීමිත තරග විභාගය මගින් බඳවා ගැනීම

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින්(02) සමන්විත වන අතර දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වීමට නියමිතය. අයදුම්කරන භාෂා පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. විෂයමාලාවන් පහත සඳහන් පරිදි වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01. | සාමාන්‍ය අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රයට තර්කාණුකූල මට්ටමේ හැකියාව, විශ්ලේෂණය කර අධ්‍යයනය කිරීමේ තීක්ෂණ බුද්ධිය, තීරණය කිරීමේ හැකියාව හා අංක ගණිත හැකියාව යන කරුණු සම්බන්ධයෙන් විභාග අපේක්ෂකගේ දැනුම පරීක්ෂණය කිරීම සඳහා සකස් කර ඇති ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02. | සාමාන්‍ය දැනුම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික සංවර්ධනය, දේශපාලනය, අධ්‍යාපනය, සංස්කෘතිය, සමාජීය, විද්‍යාත්මක කරුණු හා ක්‍රීඩා, කුඩා අත් කර්මාන්තය යනාදී කරුණු සමග ජාතික හා ජාත්‍යාන්තර කටයුතු සම්බන්ධයෙන් අපේක්ෂකගේ දැනුම පරීක්ෂණය කිරීම සඳහා සකස් කර ඇති ප්‍රශ්න පත්‍රයකි.. | පැය 01 | 100 |

**සටහන:-**

මෙය තරග විභාගයක් වන බැවින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන්නේ එක් ප්‍රශ්න පත්‍රයකට වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් ලකුණු හතලිහ ප්‍රතිශතයක් (40%) ලබා ගැනීමෙන් පමණක් බව සැලකිල්ලට ගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරග විභාගයෙන් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

**13.** විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවයේ ලේකම්වරයා විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර් ජාලය මගින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් හට තැපැල් මගින් ප්‍රතිඵල යොමු කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා සතුය. මෙම නිවේදනය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් මගින් පළ කරන අතර භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක් වෙතොත් එම අවස්ථාවේදී දෙමළ මාධ්‍යයේ නිවේදනය පරිදි කටයුතු කළ යුතුයි.

**15.** මෙම විභාගය හා බැඳි නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් සභා අන්තර්ජාලයට පිවිස ලබා ගත හැකිය.

**S. තිරුවාකරන්.**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,.
20.07.2021